සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2022 ජනවාරි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2022-03-19
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

සංයුක්ත පාලනය (Corporate Governance) යනු, සමාගම් මෙහෙයවනු ලබන සහ පාලනය කරනු ලබන පද්ධතියයි. හොඳ සංයුක්ත පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමෙන් සංවිධානයක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන සැළසුම් සමඟ සංයුක්ත පාලනය සැමවිටම ඒකාබද්ධව පවතින නිසා එය, සංවිධානයට වැදගත් වේ. යෝග්‍ය වාර්තාකරණ ව්‍යුහයක් සමඟ සංවිධානමය ව්‍යුහයක් පැවතීම, සංවිධානයක පාලන ආකෘතිමය රාමුවේ ප්‍රධාන සංරචකයන්ගෙන් එකකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හොඳ සංයුක්ත පාලන පද්ධතියක් අනුගමනය කිරීම මගින් සමාගමකට ලබාගත හැකි වාසි තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) සංවිධානමය ව්‍යුහය හැරුණු විට සංවිධානයක පාලන ආකෘතිමය රාමුවේ පවතින වෙනත් සංරචක / කොටස් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

අපේක්ෂිත ප්‍රතිඵලවලට වඩා එහි සත්‍ය ප්‍රතිඵල වෙනස්වීමට ඇති හැකියාව ව්‍යාපාර සංවිධානයකට පවතින අවදානම වේ. ව්‍යාපාරික අවදානම්, සාමාන්‍යයෙන් අභ්‍යන්තර අවදානම් සහ බාහිර අවදානම් ලෙස වර්ග කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සංවිධානයක් විසින් මුහුණදෙනු ලබන අභ්‍යන්තර අවදානම් දෙකක්(02) එකිනෙක සඳහා උදාහරණයක් සමඟ **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**සීමාසහිත SJ (පෞද්ගලික) සමාගම** ("සමාගම") කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය කරන කොම්පොස්ට් පොහොර නිෂ්පාදනයෙහි නිරතව සිටී. නව යන්ත්‍රවල ආයෝජනය කිරීම මගින් සමාගමේ ධාරිතාවය ඉහළ නැංවීමට එහි කළමණාකාරිත්වය විසින් තිරණය කර ඇති අතර, මේ සඳහා රාජ්‍ය බැංකුවකින් සහනදායී පදනම මත බැංකු ණයක් ලබාගැනීමට අපේක්ෂා කෙරේ. මෙම අරමුණ සඳහා, සමාගමේ ගණකාධිකාරිවරයා විසින් වසර 5 ක් සඳහා වන පුරෝකතනයක් සකස් කර බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. එය ස්වාධීන විගණකවරයෙකුගේ වාර්තාවක් ද සමඟ ඉදිරිපත් කරන ලෙස බැංකුව විසින් ඉල්ලීමක් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග ඉහත සඳහන් කාර්යභාරය සමඟ **සම්බන්ධ කරන්න**. (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

කොවිඩ්-19 වසංගත තත්ත්වය දිගින් දිගටම උත්සන්න වන බැවින් විගණනයන් සිදුකිරීමේදී යම් යම් ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීමට ඔබගේ විගණන ආයතනය තීරණය කර, එකඟවන ලදි. මෙම වෙනස්වීම් බොහොමයක් සිදුකර ඇත්තේ සංවරණ සීමා පැනවීම සහ තාක්ෂණයේ සිදුවූ වර්ධනයන් හේතුවෙනි. මෑතකදී පවත්වන ලද විගණන රැස්වීමේදී, කාර්යභාර හවුල්කරු විසින් දැනට පවතින වාතාවරණය තුළ විගණනයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීමේ වැදගත්කම සහ ප්‍රමාණවත් නිපුණතාවයක්, හැකියාවක් හා ආචාරධර්මවලට බැඳියාවක් පවතින පුද්ගලයන් ආයතනය මගින් සේවා නියුක්ත කළ යුතු බවත් අවධාරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණන ආයතනයක් විසින් සේවයේ නියුක්ත කරන ලද පුද්ගලයන්ගේ නිපුණතාවය සංවර්ධනය කරන ක්‍රම (methods) දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) විගනණ ආයතනයක් විසින් ස්ථාපිත කොට පවත්වාගෙන යායුතු තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග (elements) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

---

# <u>B කොටස</u>

(මුළු ලකුණු 30)

## **05** වන ප්‍රශ්නය

ඔබ, වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක් වන **පෙරේරා සහ සමාගමේ** ජ්‍යෙෂ්ඨ විගණකයෙකි. ඔබ ආයතනය පසුගිය වසර 5 ක සිට තරු 5 හෝටලයක් වන **සීමාසහිත හැපී (පෞද්ගලික) සමාගමේ (HPL)** විගණක ලෙස කටයුතු කරන අතර, ඔබ එම කාර්යභාරයේ නිරත විගණකයෙකු ලෙස පසුගිය වසරෙහි සිට කටයුතු කරනු ලබයි. ඔබ දැනට ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා වන විගණනය සැලසුම් කිරීමෙහි නිරතව සිටී.

සැලසුම්කරණ රැස්වීමේදී (planning meeting), ඔබගේ කළමණාකරු විසින් පහත සඳහන් කරුණු පිළිබඳව දැනුවත් කර ඇත:

- සමාගම විසින් සුඛෝපභෝගී මහල් නිවසක් රු. මිලියන 100 ක මුදලකට එහි කළමණාකරණ අධ්‍යක්ෂකගෙන් අත්පත් කරගෙන ඇති අතර, එය කළමණාකරණ අධ්‍යක්ෂකගේ බිරිඳ වන ප්‍රධාන මූල්‍ය නිළධාරියා වෙත නේවාසික පහසුකම් සඳහා ලබා දී ඇත.
- ප්‍රධාන මූල්‍ය නිළධාරියා විසින් සමාගමේ වත්කම් අවභාවිතා කර ඇති බවට වූ අහිතකර මාධ්‍ය ප්‍රචාරයක් මෑතකදී පළ විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි" යන පදය **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(b) HPL සමාගමට අදාලව ඔබ විසින් සිදුකළ හැකි අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) (i) HPL සමාගමට අදාලව ඔබ විසින් සළකා බැලිය යුතු වංචා අවදානම් සාධක දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(ii) HPL සමාගමේ වංචා වැළැක්වීම සහ අනාවරණය කිරීම සම්බන්ධයෙන් විගණකගේ වගකීම **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**දුලානි**, වෘත්තීය ගණකාධිකාරී ආයතනයක අදියර I සඳහා වන විභාගය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව **YK ඇසෝසියේට්ස්**, යන වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආධුනික විගණකයෙකු ලෙස සම්බන්ධ වී ඇත. ඇය, **සීමාසහිත සමන් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමෙහි (SPL)** විගණනය සඳහා අනුයුක්ත කර ඇති අතර, ඔබ එම විගණනයෙහි විධායක විගණක වේ. ඇයට දේපළ, පිරියත සහ උපකරණවලට අදාල විගණන ක්‍රියාපටිපාටි සිදුකරන ලෙස දැනුම් දී ඇත. ඔබ විසින් ඇයට සිදුකළ යුතු විගණන ක්‍රියාපටිපාටි පිළිබඳව පැහැදිලි කිරීමක් සිදුකර ඇත. කෙසේනමුත් මනා අවබෝධයක් ලබා ගැනීම සඳහා ඇය විසින් "විගණන කටයුතු සිදුකිරීමේදී විගණක වෘත්තීය සංශයදෘෂ්ඨියකින් (professional skepticism) සහ වෘත්තීය විනිශ්චයකින් (professional judgment) යුතුව සිදුකළ යුත්තේ ඇයි ද?" යන්න විමසා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) වෘත්තීය සංශයදෘෂ්ඨිය සහ වෘත්තීය විනිශ්චය අතර ඇති වෙනස **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) දේපළ, පිරියත සහ උපකරණවලට අදාල මූල්‍ය ප්‍රකාශන සැඳහුම් (assertions) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) විගණකගේ සමස්ත අරමුණු **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

බොහොමයක් වෘත්තීය ආයතනවල ඔවුන්ගේම ආචාරධර්ම සංග්‍රහයක් තිබේ. වෘත්තීය ආයතනවල සියලුම සාමාජිකයන් එකී ආචාරධර්ම සංග්‍රහයන්ට අනුකූල විය යුතුය. ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය (ඒඒටී ශ්‍රී ලංකා) ආයතනයේ සාමාජිකයන්ද එම ආයතනය පිහිටුවා ඇති ආචාරධර්ම සංග්‍රහයෙහි පවතින මූලික මූලධර්මයන්ට අනුකූල විය යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඒඒටී ශ්‍රී ලංකා ආයතනයේ සාමාජිකයින්ට අදාලවන වෘත්තීය ආචාරධර්මවල මූලික මූලධර්ම තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) ආචාරධර්මවල මූලික මූලධර්මයන්ට අනුකූල වීමේදී පැන නැගිය හැකි තර්ජන (threats) දෙකක්(02) එකිනෙක සඳහා උදාහරණයක් සමඟ **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත AB (පෞද්ගලික) සමාගම,** ("සමාගම") ඇමරිකා එක්සත් ජනපදයේ සහ ශ්‍රී ලංකාවේ සිටින සේවාදායකයන්ට උපදේශන සේවා සැපයීමෙහි නිරතව සිටී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුකොටගෙන සමාගමේ ව්‍යාපාර කටයුතුවල දියුණුවක් ලබා ඇත. පහත දැක්වෙන තොරතුරු සපයා ඇත:

**අයභාරය සහ මූල්‍ය කළමනාකරණය:**

(1) ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හඳුනාගැනීම, වගන්ති සහ කොන්දේසිවලට එකඟ වීම, ගිවිසුම් පවත්වාගෙන යාම, ඉන්වොයිසි ජනනය කිරීම සහ සේවා සැපයීම මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වගකීම් වේ. එම දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරු (මෙහෙයුම්) විසින් නායකත්වය දෙනු ලබන අතර, එහි විධායකයන් 5 දෙනෙකු සිටී. කළමනාකරු (මූල්‍ය), ගණකාධිකාරී (පොදු ලෙජර) සහ සහය ගණකාධිකාරීවරුන් දෙදෙනෙකුගෙන් මූල්‍ය දෙපාර්තමේන්තුව සමන්විත වේ.

(2) පොදු ලෙජර ගිණුම් පවත්වාගෙන යාම සහ මාසික වාර්තා ගනුදෙනුකරුවන්ට ඉදිරිපත් කිරීම වැනි දෛනික සේවාවන්හි සමාගම නිරතව සිටී. සම්මත ගිවිසුම්වලට එළඹුණු ගනුදෙනුකරුවන් 100 දෙනෙකු සිටින අතර, එකී ගිවිසුම් ප්‍රකාරව ගනුදෙනුකරුවන් වෙත මාසිකව සේවා සැපයීමට සමාගම බැඳී සිටින අතර, අයභාරය (විකුණුම්) සෑම මාස 2 කට වරක් හඳුනා ගනී.

(3) සියලුම ගනුදෙනුකරුවන්ගේ ගිවිසුම්, කළමනාකරු (මූල්‍ය) විසින් අත්සන් කරනු ලබන අතර ඒවා කළමනාකරු (මෙහෙයුම්) භාරයේ විවෘත ප්‍රදේශයක තබා ඇත. සියලුම ඉන්වොයිසි, මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සිටින විධායකයෙකු විසින් ජනනය කරනු ලබයි. ඉන්පසු එහි පිටපතක් ගණකාධිකාරී (පොදු ලෙජර) වෙත විද්‍යුත් තැපැල මාර්ගයෙන් යවනු ලබන අතර, ඔහු විසින් ඒවා සමාගමේ මූල්‍ය පද්ධතිය තුළට ජර්නල් ගත කරනු ලබයි.

(4) කළමනාකරු (මෙහෙයුම්) විසින් සෑම මාස 6 කට වරක්ම අයවැයගත අයභාරය, සත්‍ය අයභාරය සමඟ සසඳා බලන අතර, ඔහු පොදු ලෙජරය තුළ ඇති ඉන්වොයිසි සංඛ්‍යාව, පවත්නා ගනුදෙනුකාර ගිවිසුම් අනුව ජනනය කරන ලද ඉන්වොයිසි සංඛ්‍යාව සමඟ සංසන්දනය සිදු කරයි.

(5) සමහර දේශීය ගනුදෙනුකරුවන් විසින් පසුදාතම (postdated) යෙදූ චෙක්පත් ලබාදෙන අතර, එම චෙක්පත් අදාල දිනය එළඹෙන තෙක් මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සිටින විධායකයෙකු සන්තකයේ තබා ගනී. ඉන් අනතුරුව එම විධායකයා විසින් එම චෙක්පත් සහාය ගණකාධිකාරීවරයෙකු වෙත බාරදෙනු ලබයි.

(6) සහායක ගණකාධිකාරීවරයෙක් විසින් මූල්‍ය වර්ෂය අවසානයේ බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරයි.

**තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය:**

වර්ෂය තුලදී, සමාගම විසින් නව ඉන්වොයිසි පද්ධතියක් අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද අතර, එය පරීක්ෂා කිරීමකින් තොරව භාවිතයට ගෙන ඇත. එය අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද මෘදුකාංගයක් බැවින් එයට අදාලව ලේඛණ කිසිවක් තබා නොමැති අතර, පද්ධතියට ප්‍රවේශ වීම සඳහා ඇති මුරපදය මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සිටින සේවකයන් අතර බෙදාහැර ඇත. තොරතුරු තාක්ෂණ කාමරයට ප්‍රවේශවීමට කාර්යාලයේ සිටින ඕනෑම අයෙකුට ඕනෑම අවස්ථාවකදී හැකියාව ඇත. සියලුම ප්‍රධාන දත්ත, සහාය ගණකාධිකාරීවරයා විසින් හස්තමය ආකාරයෙන් (manually) පද්ධතියට ඇතුලත් කරනු ලබයි. මාසික අමතර පිටපත් (back-ups) කළමනාකරු (මූල්‍ය) ගේ කාමරය තුළ තබා ඇත. සමාගම විසින් ෆයර්වෝල්ස් (firewalls) භාවිත කරනු නොලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "අභ්‍යන්තර පාලනය" යන පදය **නිර්වචනය කරන්න.** (ලකුණු 03)

(b) අයභාරය සහ මූල්‍ය කළමනාකරණයට අදාලව **සීමාසහිත AB (පෞද්ගලික) සමාගමේ** පවතින අභ්‍යන්තර පාලන දුර්වලතා පහක්(05) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(c) ඉහත සඳහන් කළ එක් එක් දුර්වලතාවය මගහරවා ගැනීම සඳහා නිර්දේශයක් බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 05)

(d) දී ඇති තොරතුරු අනුව, **සීමාසහිත AB (පෞද්ගලික) සමාගමේ** තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය තුළ යෝග්‍යව සැලසුම් කර **නොමැති** තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් හතරක්(04) එකිනෙකට උදාහරණයක්ද සමග **පැහැදිලි කරන්න**. (ලකුණු 08)

(e) COSO අභ්‍යන්තර පාලන පද්ධතිය තුළ ඇතුළත් පාලන පරිසරයේ මූලිකාංග (elements) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

**සම්පත්,** වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක් වන **ඩීල් ඇසෝසියේට්ස්** හි ජ්‍යෙෂ්ඨ විගණකයෙකි. පාරිභෝගික භාණ්ඩ වෙළදාමෙහි නිරත වන **සීමාසහිත සැම් සමාගමේ** ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික විගණනයට ඔහු සම්බන්ධ වී ඇත. කළමනාකරිත්වය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත.

සමාගමේ මූල්‍ය කළමනාකරුගෙන් පහත සඳහන් තොරතුරු ලැබී ඇත:

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** *(රු.'000)*

| **දෙසැම්බර් 31 දිනට** | **2021** | **2020** |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ ධාරණ අගයට | 13,909 | 15,634 |
| **ජංගම වත්කම්:** | | |
| තොග (පිරිවැයට) | 44,493 | 40,417 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 102,284 | 94,199 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 356 | 15,368 |
| | 147,133 | 149,984 |
| **මුළු වත්කම්** | **161,042** | **165,618** |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 21,625 | 21,625 |
| රඳවාගත් ඉපැයීම් | (35,655) | 10,791 |
| | **(14,030)** | **32,416** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| කාලීන ණය | 35,000 | - |
| **ජංගම වගකීම්:** | | |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් | 23,378 | 24,317 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 69,057 | 53,250 |
| ගෙවිය යුතු ආදායම් බදු | 17,757 | 17,757 |
| බැංකු අයිරාව | 29,880 | 37,878 |
| | 140,072 | 133,202 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **161,042** | **165,618** |

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය** *(රු.'000)*

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2021 | 2020 |
|---|---|---|
| අයභාරය | 72,970 | 141,294 |
| විකුණුම් පිරිවැය | (75,800) | (113,568) |
| **දළ ලාභය / (අලාභය)** | **(2,830)** | **27,726** |
| බෙදාහැරීමේ වියදම් | (13,361) | (32,950) |
| පරිපාලන වියදම් | (28,500) | (16,250) |
| මූල්‍ය වියදම් | (1,755) | (1,045) |
| **ආදායම් බදු පෙර ලාභය / (අලාභය)** | **(46,446)** | **(22,519)** |
| ආදායම් බදු | - | - |
| **වර්ෂය සඳහා ලාභය / (අලාභය)** | **(46,446)** | **(22,519)** |

**වෙළෙඳ ලැබිය යුතු මුදල්වල ලැයිස්තුව**

| | රු. ('000) | වයස |
|---|---|---|
| සීමාසහිත මිල්ටන් සමාගම | 67 | දින 30 |
| සීමාසහිත කෙන් (පෞද්ගලික) සමාගම | 1,967 | දින 30 |
| සීමාසහිත රෝයි (පෞද්ගලික) සමාගම | 20,967 | දින 90 |
| සීමාසහිත මැක් පොදු සමාගම | 167 | දින 180 |
| සීමාසහිත සැම්සන් (පෞද්ගලික) සමාගම | 45,767 | දින 720 |
| ෆ්‍රැන්ක් මහත්මිය | 33,349 | දින 1,460 |
| | **102,284** | |

විගණන කාර්යභාරයට අදාල පහත සඳහන් තොරතුරු එහි විගණන ලේඛණවලින් උපුටාගෙන ඇත:

(1) විගණනයට අදාල ප්‍රමාණාත්මකභාවය රු.1,600,000/- කි.

(2) සමාගම විසින් වර්ෂය තුළදී බැංකු ණයක් ලබාගෙන ඇති අතර, එම ණය මුදලට අදාල කොන්දේසි සමාගම විසින් කඩකර ඇත. ණය ගිවිසුමට අනුව කිසියම් කොන්දේසියක් කඩකළහොත් එම ණය මුදල ඉල්ලූ සැනින් ආපසු ගෙවිය යුතුය.

(3) 2022 ජනවාරි 01 දින, 2021 දෙසැම්බර් 31 දිනට පැවති සම්පූර්ණ තොගයම රු.42,800,000/- ක මුදලකට විකුණා ඇති අතර, මේ සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමක් සිදුකර නොමැත.

(4) සමාගම විසින් වර්ෂය තුළදී ගිණුම්ගත කර ඇති ක්ෂය ප්‍රමාණය වන රු.1,250,000/-, වාර්ෂික ක්ෂය ප්‍රමාණයෙන් 50% කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත සැම් සමාගමේ** විගණන පටිපාටි ඉටුකිරීමේදී විශේෂ අවධානයක් ලබාදිය යුතු ක්ෂේත්‍ර පහක්(05) **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(b) විගණන ප්‍රමාණාත්මකභාවය නිර්ණය කිරීමේදී සළකා බැලිය යුතු සාධක හතරක්(04) **සඳහන් කරන්න.**(ලකුණු 04)

(c) **සීමාසහිත සැම් සමාගමේ** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම (going concern) පිළිබඳ උපකල්පනයේ අදාලත්වය **විමසන්න.** (ලකුණු 05)

(d) **සීමාසහිත සැම් සමාගමේ** 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට අදාල විගණන වාර්තාවේ විගණකගේ මතය සම්බන්ධයෙන් ඉහත සඳහන් (2) සිට (4) දක්වා කරුණුවල බලපෑම **තක්සේරු කරන්න.** (ලකුණු 07)

(e) විගණන වාර්තාවක විගණකගේ මතය විකරණය (modify the auditor's opinion) කරනු ලබන අවස්ථා දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |